සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අවසාන වාර පරීක්ෂණය 2016

**11 ශ්‍රේණිය** | **දෙවන බස සිංහල - I** | **කාලය පැය 01 යි.**

නම/ විභාග අංකයඃ

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. නිවැරදි හෝ වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.
  **எல்லா வினாக்களுக்கும் விடை தருக.**
  **Answer all questions. Select either the correct or the most appropriate answer.**

---

- අංක 1 සිට 05 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත පදය වෙනුවට යෙදිය හැකි වඩාත් සුදුසු පදය තෝරන්න.

  **01 - 05 வரையுள்ள வினாக்களில் கோடிடப்பட்டுள்ள சொற்களுக்குப் பொருத்தமான சொல்லைத் தெரிவு செய்க.**

  **Select the most suitable word for the items printed in thick bold letters in questions from 01 - 05.**

01 මුද්දර **<u>අලෝපු</u>** ලියුම් කවරයක් ගේන්න

(1) අලාපු (2) අලවපු (3) අලවඅපු (4) අල්ලවපු

02 අපි **<u>එන්නෝන</u>** කීයට ද?

(1) එනෝන (2) එන්නේ ඕන (3) එන්න ඕන (4) එන් ඕන

03 උත්සාහය **<u>අතාරින්න</u>** එපා

(1) අත්හරින්න (2) අත්තරින්න (3) අතහරින්න (4) අතැරෙන්න

04 තරඟය ඉදිරියටත් **<u>පැවැත්තෙනවා</u>**

(1) පැවත එනවා (2) පැවතෙනවා (3) පැවැත්එනවා (4) පැවැත්වෙනවා

05 තීන්ත බිම **<u>හැලෙන්නැතිව</u>** ගාන්න ඕන

(1) හැලෙන්නේ නැතිව (2) හලන්නැතිව (3) හලන්නේනැතිව (4) හැලෙන්නේ ඇතිව

- අංක 06 සිට 10 තෙක් ප්‍රශ්නවල දී ඇති පද අතුරින් නිවැරදි උච්චාරණය සහිත පදය තෝරන්න.

  **06 - 10 வரையான வினாக்களில் சரியான உச்சரிப்பை தரும் சொல்லைத் தெரிவு செய்க.**

  **Select the word with correct Pronuociation out of the items given in questions from 6 - 10.**

06 (1) තේගි (2) තෑගි (3) තෑහි (4) තෑකි

07 (1) ගීතය (2) ගීතද (3) හීතය (4) කීතය

08 (1) බැත්ත (2) බැද්ත (3) පැත්ත (4) පෙද්ද

09 (1) සාරිකාව (2) චාරිගාව (3) සාරිගාව (4) චාරිකාව

10 (1) ක්‍රීඩාව (2) කිරීඩාව (3) කීඩාව (4) ක්‍රීමාව

- අංක 11 - 14 තෙක් ඇති එක් එක් ප්‍රකාශය සඳහා වඩාත් ගැළපෙන ප්‍රශ්නය තෝරන්න.

  **11 - 14 வளரயான வினாக்களுக்கு மிகப் பொருத்தமான வினா வாக்கியத்தைத் தெரிவு செய்க.**

  **Select the most appropriate interrogative question for the given sentences in questions from11-14**

11 අර දොරටුව ළඟ කවුන්ටරයෙන් ටිකට් ගන්න.

(1) ටිකට් ගන්නේ කාගෙන් ද? (2) ටිකට් ගන්නේ මොකට ද?

(3) ටිකට් ගන්නේ කවු ද? (4) ටිකට් ගන්නේ කොහෙන් ද?

12 අලි නිවහන වහන්නේ සවස හයට.

(1) අලි නිවහන වහන්නේ ඇයි? (2) අලි නිවහන වහන්නේ කීයට ද?

(3) අලි නිවහන වහන්නේ කවදා ද? (4) අලි නිවහන වහන්නේ කවුද?

13 ඔයා හොඳම යහළුවා කියලා වලහා රහසින් කිව්වා

(1) වලහා රහසින් කිව්වේ මොකක්ද? (2) වලහා රහසින් කිව්වේ ඇයි ?

(3) හොඳම යහළුවා වලහා ද? (4) වලහා රහසින් කිව්වේ මොකට ද?

14 උදාර ගල උඩ ඉඳගත්තා.

(1) උදාරට ගල උඩ ඉඳගන්න ඕනෑ ද? (2) උදාර ගල උඩ ඉඳගත්තේ ඇයි?

(3) උදාර ගල උඩ ඉඳගත්තේ කොහොමද? (4) ගල උඩ ඉඳගත්තේ කවුද?

- 15 සිට 17 තෙක් ප්‍රශ්නවල නිවැරදි ව අකුරු යෙදී ඇති පදය තෝරන්න.

**15 - 17 வரையான வினாக்களில் உள்ளஎழுத்துப் பிழையற்ற சொல்லைத் தெரிவு செய்க.**

**Select the word with correct spelling in questions from 15-17.**

| | | | | |
|---|---|---|---|---|
| 15 | (1) ලිකිත භාෂාව | (2) ලිඛිත භාෂාව | (3) ලිකිත බාෂාව | (4) ලිඛිත භාශාව |
| 16 | (1) අභය බූමිය | (2) අබය භූමිය | (3) අභය භූමිය | (4) අබය බූමිය |
| 17 | (1) ප්‍රධාණ ප්‍රවේසය | (2) ප්‍රධාණ ප්‍රවේශය | (3) ප්‍රදාන ප්‍රවේශය | (4) ප්‍රධාන ප්‍රවේශය |

- අංක 18 - 20 තෙක් ප්‍රශ්නවල නොගැළපෙන පදය තෝරන්න.

**18 - 20 வரையான வினாக்களில் உள்ள பொருத்தமற்ற சொல்லைத் தெரிவு செய்க.**

**Select the inappropriate word in questions from 18 - 20.**

| | | | | |
|---|---|---|---|---|
| 18 | (1) මාර්තු | (2) ජනවාරි | (3) මැයි | (4) සිකුරාදා |
| 19 | (1) මුං ඇට | (2) බතල | (3) කඩල | (4) කුරහන් |
| 20 | (1) ලිපිනය | (2) ලියුම | (3) ලිපිය | (4) ලියමන |

- අංක 21 සිට 23 තෙක් ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට සමානාර්ථ පදය තෝරන්න.

**21 - 23 வரையான வினாக்களில் முதலில் தரப்பட்டுள்ள சொல்லின் ஒத்தகருத்துச் சொல்லைத் தெரிவு செய்க**

**Select the synonym for the initially given word in questions from 21 to 23.**

| | | | | |
|---|---|---|---|---|
| 21 ඔවදන් : | (1) අවවාද | (2) විවාද | (3) දුනුම | (4) ඔලුව |
| 22. දිනකර : | (1) දිනන | (2) තරුව | (3) සූර්යයා | (4) දවස |
| 23. බෑවුම : | (1) කන්ද | (2) නාය | (3) තැනිතලාව | (4) පල්ලම |

- අංක 24 සහ 25 ප්‍රශ්න සඳහා මුලින් දී ඇති පදයට විරුද්ධ අර්ථය දෙන පදය තෝරන්න.
- **24 - 25 வரையுள்ள வினாக்களில் முதலில் தரப்பட்டுள்ள சொல்லின் எதிர் கருத்துச் சொல்லைத் தெரிவு செய்க**

**Select the antonym for the initially given word in questions 24 and 25.**

24 සහනය :

(1) ආසනය (2) අසහනය (3) සයනය (4) සාලය

25 යුක්තිය :

(1) යුද්ධය (2) යුතුකම (3) අයුක්තිය (4) උසස්

- අංක 26 සිට 28 තෙක් එක් එක් ප්‍රශ්නයේ දී ඇති පින්තූරය සඳහා වඩාත් සුදුසු ප්‍රකාශය තෝරන්න.

**26 - 28 வரையான வினாக்களிலுள்ள படங்களுக்கு மிகப் பொருத்தமான கூற்றைத் தெரிவு செய்க.**

**Select the most suitable statement for the picture given in each question from 26 to 28**

26



(1) පිටුපසින් එන වාහන නතර වෙන්න.

(2) පිටුපසින් එන වාහන එන්න.

(3) ඉදිරියෙන් එන්න.

(4) මාර්ගය ලිස්සන සුළුයි.

27



(1) වම් පැත්තට යෑම තහනම්.

(2) දකුණු පැත්තට යන්න.

(3) දකුණු පැත්තට හැරවීම තහනම්.

(4) වම් පැත්තට යන්න.

28



(1) බස් රථ නවත්වන්න.

(2) පදික මාරුව ඉදිරියෙන්

(3) පාසල ඉදිරියෙන්

(4) වාහන නවත්වන ස්ථානය

- අංක 29 සිට 30 තෙක් අසා ඇති ප්‍රශ්නවලට යෝග්‍ය පිළිතුරු සපයන්න.

**29 வும் 30 வும் வினாக்களுக்கு பொருத்தமான விடை தருக.**

Give suitable answers for the questions from 29 to 30.

29 පහත සඳහන් පද අතුරින් පුරුෂ ලිංග පදයක් වන්නේ කුමක්ද?,

(1) නිළිය (2) ඉබ්බා (3) දොර (4) ළපටි

30 මෙම මාසය අගෝස්තු නම් මීට පෙර මාසය කුමක් ද?

(1) ජූලි (2) සැප්තැම්බර් (3) ජූනි (4) ඔක්තෝම්බර්

- අංක 31 සිට 32 තෙක් එක් එක් ප්‍රශ්නවල වාක්‍ය දෙක බැගින් දී ඇත. එම වාක්‍ය දෙක සම්බන්ධ කර එක වාක්‍යයක් ලෙස නිවැරදි ව ලියා ඇති වාක්‍යය තෝරන්න.

**31 - 32 வரையான வினாக்களில் வரும் தனி வாக்கியங்களில் பொருள் வேறுபடாதவாறு அமைந்துள்ள தொடர் வாக்கியத்தைத் தெரிவு செய்க.**

Two sentences are given in each question from 31 - 32 . Select the correct sentence that combines both separate sentences.

31 අම්මා බත් ඉව්වා ය. අම්මා කෑම බෙදුවා ය.

(1) අම්මා කෑම බෙදා බත් ඉව්වා ය. (2) අම්මා බත් උයා කෑම බෙදුවා ය.

(3) අම්මා බත් උයමින් කෑම බෙදුවා ය. (4) අම්මා බත් උය උයා කෑම බෙදුවා ය.

32 ගුරුතුමිය රූප සටහන් අඳියි. ගුරුතුමිය ගණිතය පාඩම උගන්වයි.

(1) ගුරුතුමිය රූප සටහන් ඇඳ පාඩම උගන්වයි.

(2) ගුරුතුමිය රූපසටහන් අඳිමින් ගණිතය පාඩම උගන්වයි.

(3) ගුරුතුමිය රූපසටහන් ඇඳලා පාඩම උගන්වයි.

(4) ගුරුතුමිය ගණිතය පාඩම උගන්වමින් රූප සටහන් අඳියි.

- අංක 33 සිට 34 තෙක් ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.

**33 - 34 வரையான வினாக்களில் கீறிட்ட இடங்களுக்குப் பொருத்தமான சொல்லைத் தெரிவு செய்க.**

Select the most suitable word for filling the blanks in questions from 33 - 34

33 ................................................... හීල්දානය බෙදමු.

(1) විදුහල්පතිතුමාට (2) අම්මාට (3) හාමුමහත්තයාට (4) හාමුදුරුවන්ට

34 නිවාසය ........................................................ අපි

(1) හැදිලා (2) හැදීම (3) හදන්නේ (4) හදලා

- දී ඇති ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

**தரப்பட்டுள்ள வினாக்களுக்கு விடை தருக.**

Answer the following question.

35 ක්‍රි. ව. 1948 දී ශ්‍රී ලංකාවට නිදහස ලැබුණි.

ඉහත සඳහන් වාක්‍යයේ තද කළු අකුරෙන් මුද්‍රිත සංඛ්‍යාව අකුරෙන් නිවැරදි ව ලියා ඇති වරණය තෝරන්න.

(1) දහනවයයි හතළිස් අට (2) අටදහස් හාරසිය අනූ එක

(3) දහනවදහස් හතළිස් අට (4) එක්දහස් නවසිය හතළිස් අට

- අංක 36 සිට 40 තෙක් ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.

**36 - 40 வரையான வினாக்களில் இலக்கண வழுவற்ற வாக்கியங்களைத் தெரிவு செய்க.**

Select the gramanatically correct sentences in questions from 36 to 40.

36 (1) සුළඟට අතු සෙලවුණි. (2) සුළඟට අතු සෙලවූහ.

(3) සුළඟට අතු සෙලවුණාය. (4) සුළඟට අතු සෙලවුණෝය.

37 (1) මමත් අම්මාත් පොළට යයි . (2) අම්මාත් මමත් පොළට යමි.

(3) අම්මාත් මමත් පොළට යමු. (4) මමත් අම්මාත් පොළට යන්නෝය.

38. (1) ධර්මශාලාව තුළ දෙමව්පියෝ සිටිති. (2) ධර්මශාලාව තුළ දෙමව්පියන් සිටිති.

(3) ධර්මශාලාව තුළ දෙමව්පියෝ සිටියි. (4) ධර්මශාලාව තුළ දෙමව්පියන් සිටියි.

39. (1) මව්ලවිතුමා සමඟ පූජකතුමා සහභාගි වෙති. (2) මව්ලවිතුමා සමඟ පූජකතුමා සහභාගි වූ සේක.

(3) මව්ලවිතුමා සමඟ පූජකතුමා සහභාගි වූවාය. (4) මව්ලවිතුමා සමඟ පූජකතුමා සහභාගි වෙයි.

40. (1) නංගී මල් නෙළුවාය. (2) නංගී මල් නෙළුවේය.

(3) නංගී මල් නෙළූහ. (4) නංගී මල් නෙළති.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය 2016

11 ශ්‍රේණිය **දෙවන බස සිංහල - II** කාලය පැය 02 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

සැළකිය යුතුයි.

- 1 කොටසේ අංක 1 හා 2 ප්‍රශ්න ඇතුළුව 11 කොටසින් එක් ප්‍රශ්නයක් ද 111 කොටසින් ප්‍රශ්න දෙකක් ද තෝරා ගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

**கவனிக்க**

- **பகுதி 01 இல் இருந்து 1 ஆம் 2ஆம் வினாக்களுக்கும் பகுதி II இல் இருந்து ஏதாவது ஒரு வினாவுக்கும் பகுதி III இல் இருந்து இரு வினாக்களுக்குமாக மொத்தம் ஐந்து வினாக்களுக்கு மாத்திரம் விடை எழுதுக.**

**Note :**

- **Answer five questions only selecting 1st and 2nd questions from part 1 and one question from the part 11 and two questions from part 111.**

1 කොටස

01. දී ඇති මාර්ගෝපදේශ ආශ්‍රය කර ගනිමින් පහත දක්වෙන මාතෘකා වලින් එකක් පිළිබඳ වචන 100 ක් පමණ රචනයක් ලියන්න.

**பின்வரும் தலைப்புக்களில் ஒன்றைத் தெரிவுசெய்து தரப்பட்ட விடயங்களை உள்ளடக்கி ஏறத்தாழ 100 சொற்கள் அமையுமாறு கட்டுரை ஒன்று எழுதுக.**

Write essay in about **100** words on any **one** of the following topics in accordance with the given guide lines.

(අ) වැස්ස කතා කරයි.
  (1) මෙය කල්පිත මාතෘකාවක් සේ සලකා කරුණු ඉදිරිපත් කිරීම.
  (2) වැස්ස නිසා මිනිසාට සැලසෙන වාසි
  (3) මිනිසාට අහිතකර අයුරින් වැස්ස ලබා නොදෙන බව
  (4) වැස්ස අයහපත් වීමට මිනිසුන් කරන වැරදි ක්‍රියා
  (5) සමාලෝචනය

(ආ) උපන්දින තෑග්ගක් ලැබුණු ද?
  (1) උපන්දින උත්සවය පැවති ආකාරය
  (2) තෑගි දුන් අය
  (3) ඒ තෑගි අතර තිබූ විශේෂ තෑග්ග පිළිබඳ විස්තර
  (4) තෑග්ග නිසා මගේ සිතේ ඇති වූ සතුට
  (5) සමාලෝචනය

(ඉ) මගේ ගෙවත්ත
  (1) ගෙවත්තේ පිහිටීම
  (2) එහි වගාකර ඇති දේවල්
  (3) ගෙවත්ත වගා කළ ආකාරය
  (4) ගෙවතුවගාවෙන් මට ලැබුණු ප්‍රයෝජන
  (5) සමාලෝචනය

(ඊ) සිංහල භාෂාව ඉගෙනීමේ වැදගත්කම

(1) ජාතික භාෂාව ලෙස සිංහල භාෂාවේ ඇති වැදගත් කම

(2) සිංහල භාෂාව ඉගෙනීමට ඇති මාර්ග

(3) සිංහල භාෂාව ඉගෙනීමෙන් ලැබෙන ප්‍රයෝජන

(4) එය ඉගෙනීමෙන් පසු, කරන සේවය

(5) සමාලෝචනය

(උ) ඩෙංගු උවදුර පිටු දකිමු

(1) ඩෙංගු උවදුර හඳුන්වාදීම

(2) විවිධ පිරිස් ඩෙංගු පැතිරවීම කෙරෙහි කරන බලපෑම

(3) මෙමගින් මහජනතාවට ඇතිවන හානි

(4) ඩෙංගු උවදුර පිටු දැකීමට ගත හැකි ක්‍රියාමාර්ග

(5) නිගමනය. (ලකුණු 20 යි)

- දී ඇති පින්තූරය බලා ඒ ඇසුරින් අර්ථවත් වාක්‍ය 05 ක් ගොඩනගන්න. (වාක්‍යයක අවම වශයෙන් වචන 4ක් වත් තිබිය යුතුය.)

**பின்வரும் படத்தை அடிப்படையாகக் கொண்டு ஐந்து கருத்துள்ள வாக்கியங்கள் எழுதுக.**

**(ஒரு வாக்கியத்தில் நான்கு சொற்களுக்கு குறையாமல் இருத்தல் வேண்டும்)**

Compose five meaningful sentences with reference to the given picture. (There should be four words meaningfully in a sentence.)

The National e-learning Portal for The General Education



(ලකුණු 10යි)

## II කොටස / பகுதி 11 / Part II

- 3, 4 ප්‍රශ්නවලින් එකකට පමණක් උත්තර ලියන්න.
  **3, 4 ஆம் வினாக்களுள் ஒன்றுக்கு மட்டும் விடை எழுதுக**
  Answer one out of the questions 3 and 4.

03 පහත සඳහන් කවි පෙළ කියවා අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.
**பின்வரும் பாடலை வாசித்து அதன் கீழ் தரப்பட்டுள்ள வினாக்களுக்கு பூரணமான வாக்கியங்களில் விடை எழுதுக.**
Answer the given questions with reference to the following verse text.

පින්සිදු වන්නේ අනේ බාල ළමුන්නේ
මගේ කුඩා නිවස කඩා බිම නොදමන්නේ

වනේ පුරා සොයා ගොසින් කෝටු කඩාලා
කුඩා කුඩා කැබලි තුඩින් මෙහි ගෙනවිල්ලා
ගසේ මුදුන් අත්ත උඩින් කෝටු තබාලා
උදේ පටන් දවස පුරා කුඩු තනාලා

කොළේ කොළේ දමා කුඩා නිවස සදන්නේ
මගේ දයාබිරිඳ නිතර එය සරසන්නේ
රැළේ රැළේ පුළුන් දමා යහන සදන්නේ
අගේ මටයි ළදරුවනේ එය නොකඩන්නේ

(i) වනේ පුරා සොයා ගොසින් කඩන්නේ මොනවා ද?
(ii) ගසේ මුදුන් අත්ත උඩ සාදන්නේ මොකක් ද?
(iii) යහන සාදන්නේ මොනවා දමා ද?
(iv) නිවස සරසන්නේ කවු ද?
(v) ළදරුවන්ගෙන් කරන ඉල්ලීම කුමක් ද? (ලකුණු 02 × 05 = 10යි)

04 පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.
**பின்வரும் உரைப் பகுதியை வாசித்து அதன் கீழ் தரப்பட்டுள்ள வினாக்களுக்கு விடை எழுதுக.**
Answer the given questins with reference to the following prose text.

ලෝකයේ උසම දිය ඇල්ල පිහිටා තිබෙන්නේ වෙනිසියුලාවේය. ඒ ටෙපයි කඳුවැටියේ පිහිටි පරේකුපාමෙරු දිය ඇල්ලයි. උස අඩි 3212 කි. මෙහි උසේ ප්‍රමාණ ඉතා වැඩි නිසාම දිය ඇල්ලෙන් ඇදහැලෙන දිය කඳ සුළඟ සමග මුසු වී මීදුම බවට පත්වේ.

මේ දිය ඇල්ල නිසා ප්‍රසිද්ධ වූ පුද්ගලයෙක් සිටියි. ඔහු ජමී ක්‍රෝෆෝඩ් ඒන්ජල්ය. ඔහු ෆ්ලෙමින්ගෝ නැමති තමන්ගේ ගුවන්යානය කඳුමුදුනට ඉහළින් පියාසර කරවීය. එය ටෙපයි කඳු මුදුනට ගොඩබැසීමට තැත් කිරීමේ ආපදාවකට ලක්වීය. ජිම්ක්‍රෝෆෝඩ් ඒන්ජල් ද එම යානයේ ගමන්ගත් සියලු දෙනා ද ටෙපයි සිට පාගමනින් ම ගොස් ජීවිත බේරා ගත්හ. මඩේ එරුණු යානය අවුරුදු තිස්තුනක් ඒ අයුරින්ම තිබුණි. මෙම සිදුවීම නිසා දිය ඇල්ල නැරඹීමට ලක්ෂ ගණන් ජනයා පැමිණෙති. අහස වලාකුළින් බර වුණු දිනවල මෙහි සුන්දරත්වය නැරඹිය නොහැක.

(i) ඉහත ඡේදයේ සඳහන් දිය ඇල්ල පිහිටා තිබෙන රට කුමක් ද?
(ii) එම දිය ඇල්ල ගලා බසින්නේ කුමන කන්දේ සිට ද?
(iii) දිය ඇල්ලෙන් ඇද හැලෙන ජලය මීදුමක් බවට පත් වන්නේ කෙසේද?

(iv) මෙම දිය ඇල්ල නිසා ප්‍රසිද්ධ වූ පුද්ගලයා කවුද ?

(v) ඉහත ඡේදයේ මූලික අදහස තනි වාක්‍යයකින් ලියා දක්වන්න. (ලකුණු 02 × 5 = 10යි)

## III කොටස / பகுதி 111 / Part III

- 5, 6 ප්‍රශ්න දෙකටම උත්තර ලියන්න.
  **5 ஆம் 6 ஆம் வினாக்களுக்கு விடை எழுதுக.**
  Answer both question 5 and 6.

05 වික්‍රමසිංහපුර මහා විද්‍යාලයේ සාහිත්‍ය සංගමයේ ලේකම් ඔබයැයි සිතන්න. එම විද්‍යාලය පිහිටා තිබෙන්නේ බකමූණ මුණමල්දෙනිය ගමේ ය. ඔබ විද්‍යාලයේ 11 වන ශ්‍රේණියේ ළමුන් 50 දෙනෙකුට කොළඹ වරාය නැරඹීම සඳහා අවසර ලබා ගැනීමට අවශ්‍ය ය. ඒ සඳහා කොළඹ, තැපැල් පෙට්ටිය 14, හි පිහිටි වරාය අධිකාරියේ අධිකාරිතුමාට විදුහල්පතිතුමා මගින් යවන ලිපියක් සකස් කරන්න. (ලකුණු 10යි)
**தரப்பட்ட விடயங்களை உள்ளடக்கி கடிதம் ஒன்று எழுதுக.**
Write a letter according to the given guide lines.

නැතහොත්
**அல்லது**
**OR**

ඔබේ ගමේ පුබුදු යෞවන සමාජය මගින් පවත්වනු ලබන නාට්‍ය සංදර්ශනය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංස්කෘතික නිලධාරිතුමාගේ ප්‍රධානත්වයෙන් 2016 12 25 දින පස්වරු තුනට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රංගනශාලාවේ දී පැවැත්වෙන බව දන්වා ආරාධනා පත්‍රයක් සකස් කරන්න. ඔබ යෞවන සමාජයේ ලේකම් යැයි සිතන්න. (ලකුණු 10යි)
**தரப்பட்ட விடயங்களை உள்ளடக்கி அழைப்பிதழ் ஒன்று எழுதுக.**
Writing an invitation card according to the given guide lines.

06. පහත දැක්වෙන දෙමළ වාක්‍ය හෝ ඉංග්‍රීසි වාක්‍ය හෝ සිංහලට පරිවර්තනය කරන්න.
**பின்வரும் சிங்கள வாக்கியங்களை அல்லது ஆங்கில வாக்கியங்ளை தமிழில் மொழிபெயர்க்க.**
Translate the given Tamil / English sentences into Sinhala.

(i) **நரி காடொன்றில் உலாவியது.**
(ii) **பாதையின் இருபக்கமும் வரிசையாக நில்லுங்கள்.**
(iii) **குருடன், பானைக்கு அடியொன்று அடித்தான்.**
(iv) **துறைமுகத்தை பார்வையிட அனுமதிச் சீட்டு தேவையா?**
(v) **அறிவுறுத்தல்களை சொல்லித் தருகிறீர்களா ?**

(i) A fox was walking in the forest.
(ii) Be in a line both side of the road.
(iii) The blind man hit the pot.
(iv) Do you need permission to visit harbour ?
(v) Can you explain the instructions? (ලකුණු 02 × 5 = 10 යි)

නැතහොත්
**அல்லது**
**OR**

චිත්‍ර ප්‍රදර්ශනයක් නැරඹීම සඳහා තොරතුරු දැනගැනීම පිණිස කරන දුරකතන සංවාදයක් ලියන්න. ඒ සඳහා පහත සඳහන් කරුණු උපයෝගි කර ගන්න.
**தரப்பட்ட விடபங்களை உள்ளடக்கி தொலைபேசி உரையாடல் ஒன்று எழுதுக.**
Including all the given contents writing down a mobile phone conversation.

(1) ආමන්ත්‍රණය සහ සුබපැතීම
(2) කරුණු විමසීම
(3) කරුණු පැහැදිලි කිරීම
(4) මග විමසීම
(5) ස්තුතිය (ලකුණු 10යි)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | |
|---|---|---|---|
| 1 - (2) | 11 - (4) | 21 - (1) | 31 - (2) |
| 2 - (3) | 12 - (2) | 22 - (3) | 32 - (2) |
| 3 - (1) | 13 - (1) | 23 - (4) | 33 - (4) |
| 4 - (4) | 14 - (4) | 24 - (2) | 34 - (3) |
| 5 - (1) | 15 - (2) | 25 - (3) | 35 - (4) |
| 6 - (2) | 16 - (3) | 26 - (4) | 36 - (1) |
| 7 - (1) | 17 - (4) | 27 - (3) | 37 - (3) |
| 8 - (3) | 18 - (4) | 28 - (4) | 38 - (1) |
| 9 - (4) | 19 - (2) | 29 - (2) | 39 - (4) |
| 10 - (1) | 20 - (1) | 30 - (1) | 40 - (1) |

(ලකුණු 01 × 40 = 40)

## II කොටස

01 රචනාව සඳහා ලබාදෙන උපරිම ලකුණු ප්‍රමාණය ලකුණු 20 කි.

(1) අදහස්වලට — ලකුණු 06 යි.
වචන සංඛ්‍යාව සියයට නොඅඩු විය යුතුයි.
දී ඇති මාර්ගෝපදේශ අනුව කරුණු ඉදිරිපත් කළ යුතුය.

. (2) අන්තර්ගතය — ලකුණු 10 යි.
නිවැරදි වචන හා වාක්‍යාංශ තිබිය යුතුය.
නිර්මාණාත්මක විය යුතුය.

(03) ශිල්පීය දක්ෂතා — ලකුණු 4 යි
ව්‍යාකරණානුකූල විය යුතුය.
අක්ෂරවින්‍යාසය නිවැරදි විය යුතුය. මුළු ලකුණු 20 යි

02 වන ප්‍රශ්නයට ලකුණු 10ක් පිරිනැමේ.
* නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතුව ව්‍යාකරණානුකූලව වචන හතරකට නොඅඩුව ලියා ඇති එක් වාක්‍යයක් සඳහා ලකුණු 02 බැගින් ද අර්ථය පමණක් ඇතත්ම එක ලකුණ බැගින් ද ලබාදිය යුතුය. මුළු ලකුණු 10 යි

03 වන ප්‍රශ්නයට ලකුණු 10ක් පිරිනැමේ.
(i) කෝටු (ii) කූඩු (iii) පුළුන් (iv) බිරිඳ
(vi) කූඩුව කඩන්න එපා කියා (ලකුණු 2 ×5 = 10)

04 (i) වෙනිසියුලාවේ (ii) ටෙපයි කඳුවැටිය (iii) සුළඟ සමග මුසු වූ නිසා
(iv) ජිම් කෝෆෝඩ් ඒන්ඩල් (v) ජිම් කොෆෝඩ් නිසා ප්‍රසිද්ධියට පත් වූ ලෝකප්‍රකට පරේකුපාමෙරු දිය ඇල්ල (ලකුණු 2 × 5= 10යි)

## III කොටස

05 වන ප්‍රශ්නයට ලකුණු 10 ක් පිරිනැමේ.
අපේක්ෂිත පිළිතුරු
ලිපියේ ආකෘතිය — 04 යි. (යවන්නාගේ ලිපිනය, දිනය, ලබන්නාගේ ලිපිනය, ආමන්ත්‍රණය මාතෘකාව අත්සන හා තනතුර)
අන්තර්ගතය — 04යි. (ලිඛිත බසින් තිබිය යුතුය. ළමුන් සංඛ්‍යාව නරඹන දිනය, ඉල්ලීම ඇතුළත් විය යුතුය.
ශිල්පීය දක්ෂතා — 02යි. අක්ෂර වින්‍යාසය හා ව්‍යාකරණානුකූල බව.

**නැතහොත්**
ආකෘතිය — 04 යි. (දිනය, ස්ථානය, වෙලාව, ආරාධිත අමුත්තා / අරමුණ ආදිය...)
අන්තර්ගතය — 04යි. (නිර්මාණාත්මක විය යුතුය.)
ශිල්පීය දක්ෂතා — 02යි. (අක්ෂර වින්‍යාසය, ව්‍යාකරණානුකූල බව) මුළු ලකුණු 10 යි.

06 වන ප්‍රශ්නයට ලකුණු 10 ක් පිරිනැමේ.
(i) නරියා කැළේ ඇවිද්දේය. (ii) පාර දෙපැත්තේ පෝලිමට සිටින්න. (iii) අන්ධයා මුට්ටියට පහරක් ගැසුවේය. (iv) වරාය නැරඹීමට ප්‍රවේශපත්‍ර අවශ්‍ය ද? (v) උපදෙස් ටික කියලා දෙනවාද?

**නැතහොත්**
* ලකුණු 10 ක් පිරිනැමේ * දී ඇති මාර්ගෝපදේශ වලට අනුව නිර්මාණාත්මකව ලියා තිබිය යුතුය. අවස්ථාවට ගැළපෙන ලෙස ප්‍රමාණාත්මක විය යුතුය. (මුළු ලකුණු 10 යි.)

The National e-learning Portal for The General Education